**මාර්ග අංශ සහායක ව්‍යාපෘතිය - ග්‍රාමීය මාර්ග නියමු සංරචකය - 2013**

---

මාර්ග අංශ සහායක ව්‍යාපෘතියේ - ග්‍රාමීය මාර්ග නියමු සංරචකය 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය(ජාසංසං) අතර 2006 ජනවාරි 16 දින එළඹි අංක 4138 සීඊ දරන සංවර්ධන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.01(ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ක්‍රියාත්මක කිරීම,අරමුණු,අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

මාර්ග අංශ සහායක ව්‍යාපෘතියේ සංවර්ධන ණය ගිවිසුමට අනුව, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ පහත දැක්වෙන කරුණු ඇතුළත්ව පළාත් සභා සඳහා කොන්ත්‍රාත් 03 ක හා ප්‍රාදේශීය සභා සඳහා කොන්ත්‍රාත් 09 ක නියමු වැඩසටහනක් කර ගෙන යාමයි.

(අ). ප්‍රාදේශීය සභාවල ග්‍රාමීය මාර්ග කළමනාකරණය හා නඩත්තු ක්‍රම ශක්තිමත් කිරීම,

(ආ). ග්‍රාමීය මාර්ග ප්‍රවේශකත්වය වැඩි දියුණු කිරීම සඳහා ආසන්න වශයෙන් කිලෝ මීටර් 635 ක ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය හා නඩත්තු කිරීම,

(ඇ). ප්‍රාදේශීය සභා ව්‍යාපෘතිවල ග්‍රාමීය මාර්ග කළමනාකරණය හා නඩත්තු ක්‍රම ශක්තිමත් කිරීම ඇතුළුව කාර්මික සහය ලබාදීම සඳහා කොන්ත්‍රාත් කළමනාකරණය හා ඉදිකිරීම් අධීක්ෂණය,

(ඈ). පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය, පළාත් සභා හා ප්‍රාදේශීය සභා ව්‍යාපෘති කාර්යය මණ්ඩලය, කොන්ත්‍රාත්කරුවන් සහ උපදේශකවරුන් සඳහා ධාරිතාවය ගොඩනැගීම ඇතුළු පුහුණු හා ආයතනික සංවර්ධනය,

(ඉ). ව්‍යාපෘතියේ “බී” කොටස සඳහා ස්වාධීන කාර්මික විගණනයක් සිදු කිරීම සහ

(ඊ). ව්‍යාපෘතියේ “බී” කොටස සඳහා අවශ්‍ය වන භාණ්ඩ හා උපකරණ ලබා දීම.

සංවර්ධන ණය ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො. මිලියන 14 ක් වන අතර, සම්පූර්ණ මුදලම මූල්‍යනය කිරීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. 2006 මැයි 01 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කළ අතර, 2011 මාර්තු 31

වන විට නිමකිරීමට නියමිත විය. පසුව ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2014 සැප්තැම්බර් දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදී හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

---------------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය හා ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂාකිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය,අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව, මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි.පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සළකණු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්,වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ). අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ). ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඇ). ණය යටතේ ආපසු ගැනීම් සංවර්ධන ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුනේ ද යන බව.

(ඈ). ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඉ). ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(ඊ). පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුනේ ද යන බව.

(උ). විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌණ පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේ ද යන බව, සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේ ද යන බව.

(ඌ) සංවර්ධන ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව.

(එ). මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව සහ

(ඒ). සංවර්ධන ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

**3. මතය**

**-------**

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ). 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ). සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ). 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ). සංවර්ධන ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ). මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ගයක් ගෙන තිබූ බව සහ,

(ඊ). සංවර්ධන ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

### 4.1 මූල්‍ය කාර්ය සාධනය

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ව්‍යාපෘති වියදම රු. 36,813,813 ක් වන අතර, 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු. 1,641,981,426 කි. සමාලෝචිත වර්ෂය සඳහා වියදම පෙර වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 8,758,861 | 13,663,714 | 1,205,430,909 |
| භාණ්ඩ | 23,566,280 | - | 53,461,281 |
| උපදේශක සේවා | 590,000 | 1,493,000 | 173,050,422 |
| පුහුණුව | - | - | 8,082,574 |
| වර්ධක හා පරිපාලන පිරිවැය | 3,898,672 | 11,183,912 | 201,956,240 |
| | 36,813,813 | 26,340,626 | 1,641,981,426 |

### 4.2 විශේෂ (ඩොලර්) ගිණුම

මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකි වූ තොරතුරු අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලමබැ) විශේෂ (ඩොලර්) ගිණුමක් (උප ලෙජරය ගිණුම් අංක 125) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් නමින් ව්‍යාපෘතියේ (ග්‍රාමීය මාර්ග නියමු සංරචකය) කාර්යයන් සඳහා ආරම්භ කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ විශේෂ (ඩොලර්) ගිණුමේ මෙහෙයුම්වල සාරාංශයක් හා 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය පහත දැක්වේ.

| | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 77,747.12 | 9,886,386 |
| එකතු කළා - ඌන පූර්ණයන් | 292,609.65 | 37,724,765 |
| විදේශ විනිමය වාසිය | - | 460,286 |
| | 370,356.77 | 48,071,437 |
| අඩු කළා - ආපසු ගැනීම් | 293,302.28 | 37,996,331 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 77,054.49 | 10,075,106 |

## 5. විගණන නිරීක්ෂණ

### 5.1 මූල්‍ය සමාලෝචනය

අරමුදල් මූල්‍යනය, සමාලෝචිත වර්ෂය තුළ ආර්.එස්.ජ්.පී. වෙත අයවැය වෙන්කිරීම් සහ සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2013 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනයට අදාල, වැදගත් සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

| ප්‍රභවය | අරමුදල් උපයෝජනය | | | | | | 2013 දෙසැම්බර් 31දින දක්වා අරමුදල් උපයෝජනය | | 2013 දෙසැම්බර් 31දින දක්වා උපයෝජනය ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|---|---|---|---|
| | මූල්‍යනය කිරීම සඳහා ණය ගිවිසුමේ එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | | 2013 වර්ෂය තුල අරමුදල් උපයෝජනය | | | | |
| | එජඩො මිලි. | රු. මිලි. | එජඩො මිලි. | රු. මිලි. | එජඩො මිලි. | රු. මිලි. | එජඩො මිලි. | රු. මිලි. | |
| ලෝක බැංකුව | 14.4 | 1,632 | 0.08 | 10 | 0.28 | 36.17 | 14.3 | 1,622.8 | 99 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ශ්‍රීලංර | 0.21 | 25 | - | 0.5 | - | 0.63 | 0.17 | 19.1 | 80 |
| | ------ | -------- | | ------- | | ------- | -------- | --------- | |
| එකතුව | 14.61 | 1,657 | | 10.5 | | 36.8 | 14.47 | 1,641.9 | |
| | ==== | ==== | | === | | === | ==== | ===== | |

**5.2 භෞතික කාර්ය සාධනය**

**-------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). ග්‍රාමීය මාර්ග ප්‍රවේශය වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘතිය යටතේ ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 635 ක් පුනරුත්ථාපනය සහ නඩත්තු කිරීමට අපේක්ෂාකර තිබුණද, ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර වසර හතක් ගතවී තිබුණද, 2013 දෙසැම්බර් 31 දිනට ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 160 ක් පමණක් පුනරුත්ථාපනය කර තිබුණි.

(ආ). 2014 මැයි මස රිදීමාලියද්ද, මීගහකිවුල සහ සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල වැඩබිම්වල සිදුකරන ලද විගණන පරීක්ෂණවේදී පහත කරුණු අනාවරණය විය.

(i). වරාපිටිය,අලුකැටියාව, දෙමටබැද්ද, වරාගම, සෙනවිගම - තිස්සපුර සහ මුතුකණ්ඩිය ගම්මානවල පිහිටා ඇති දුර කිලෝමීටර් 24.1 ක් වූ මාර්ග 6 ක් රු.මිලියන 114.5 ක වියදමින් පුනරුත්ථාපනය කර තිබුණි. කෙසේ වුවත්, මාර්ග පුනරුත්ථාපන කාර්යන් සඳහා අත්‍යවශ්‍ය බෝක්කු, කාණු සහ දිය පැන්නුම් වැනි අනිකුත් ව්‍යුහයන් ඉදිකර නොතිබුණි. එම නිසා පරීක්ෂණ දිනට මාර්ගවල තත්වය අසතුටුදායක විය.

(ii). රු.මිලියන 84.6 ක වියදමින් පුනරුත්ථාපනය කරන ලද වරාපිටිය, සෙනවිගම - තිස්සපුර, අලුකැටියාව සහ වරාගම ගම්මානවල පිහිටා ඇති දුර කිලෝමීටර් 19.1 ක් වූ මාර්ග 4 ක් පුනරුත්ථාපනය කිරීම්වලින් මාස 16 කට පසු තද වැසි නිසා සේදී ගොස් තිබුණි. ඒ අනුව එවැනි මාර්ගවල පුනරුත්ථාපන කටයුතු සතුටුදායක ලෙස සිදුකර නොමැති බව නිරීක්ෂණය විය.

(iii). ව්‍යාපෘති මඟින් පුනරුත්ථාපනය කරන ලද ග්‍රාමීය මාර්ගවල දිගුකාලීන භාවිතය සහතික කිරීම සඳහා එම මාර්ගවල නඩත්තු කටයුතු ක්‍රමවත්ව සිදුකර නොමැති බව නිරීක්ෂණය විය. තවද, රිදීමාලියද්ද, මීගහකිවුල සහ සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල රු. මිලියන 221.8 වියදමින් පුනරුත්ථාපනය කරන ලද ග්‍රාමීය මාර්ග 11 ක් අඛණ්ඩ පදනමක් මත ක්‍රමවත් නිසි නඩත්තුවක් නොමැති වීම මත අබලන් වී තිබුණි.

(iv). මාර්ග නඩත්තු කටයුතු සඳහා රු. මිලියන 13.8 ක වියදමින් මිලදී ගෙන තිබූ කොන්ක්‍රීට් මිශ්‍රණ, දම්වැල් කියත් වැනි වාහන හා උපකරණ බලාපොරොත්තු වූ කාර්යයන් සඳහා භාවිතා කර නොතිබුණි. රිදීමාලියද්ද, මීගහකිවුල සහ සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභා විසින් එවැනි වාහන හා උපකරණ කුලී පදනම මත තුන්වන පාර්ශවවල භාවිතය සඳහා ලබා දී තිබුණි.